**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය**

චක්‍රලේඛ අංක : EDCS/GM/Covid/චක්‍රලේඛ/2020/11/03

2020-11-07

සියලුම නි/සාමාන්‍යාධිකාරීන් (දිස්ත්‍රික්),

සියලුම ස/සාමාන්‍යාධිකාරී (දිස්ත්‍රික්),

**සාමජිකයින් වෙත විශේෂ ණය සහන ලබා දීම**

සමාජිකයින් වෙත ණය සහන ලබා දීම සඳහා 2020-10-27 දින ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් තීරණ චක්‍රලේඛ අංක EDCS/GM/Covid/චක්‍රලේඛ/2020/11/02 ඉදිරිපත් කර ඇති අතර එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදීම පහත සඳහන් විශේෂ සහනයද මෙම Covid-19 තත්වය මත එම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි වලට යටත්ව පහත සඳහන් පරිදි කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

**කොටස් වටිනාකම**

I. පුද්ගල ඇප මත ණය ලබා දෙන අවස්ථාවලදී ණය මුදල රු.1,000,000/- වඩා වැඩි වන අවස්ථා වලදී රු.75,000/-ක කොටස් තැම්පතුවක් තිබීම ප්‍රමාණවත් වේ.

II. රු.1,000,000/- ට වඩා වැඩි පුද්ගල ඇපමත ණය සඳහා ඇපකරුවන් විසින් රු.50,000/- ක් කොටස් ගිණුමේ තැම්පත් කර තිබිය යුතුය.

III. පුද්ගල ඇප මත ණය ලබා දීමේදී ණය ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කල යුතු කොටස් ප්‍රමාණය ණයකරුගේ ලිඛිත ඉල්ලීමක් මත ලබා දෙන ණය මුදලින් අඩු කර ගත හැකි වන අතර ණය ගොනුව සුදුසු කිරීමට කොටස් සම්පූර්ණ කිරීමේ ඉල්ලීම් ලිපිය ප්‍රමාණවත් වේ.

IV. පුද්ගල ඇපමත ණය සඳහා ඇපකරුවන්ගේ වයස අවු.60 විය යුතු අතර ණය ඉල්ලුම්කරුගේ හෝ ඇපකරුගේ වයස අවු.60 සම්පූර්ණ වීමට පෙර ණය අවසන් විය යුතුය.

V. සාමාජිකයින් විසින් භාණ්ඩ ණය ඉල්ලුම් කිරීමේදී වෙනත් වාණිජ බැංකු හා මූල්‍ය ආයතන වලින් ලබා ගෙන ඇති ණය 40% අවකරණ සීමාවට බාධාවක් වේ නම් එම ණය ගෙවා අවසන් කිරීමට මෙම ණය ලබා දීමට හැකි වේ. අනුමත ණය මුදලින් පිට ණය පළමුව ගෙවා එම ණය අවසන් බවට තහවුරුවක් ලබා ගැනීමෙන් පසු ඉතිරි මුදල ගෙවීමට කටයුතු කල හැක.

VI. භාණ්ඩ ණය ගෙවා නැවත භාණ්ඩ ණය ලබා දීමටත් එසේ ලබා දීමේදී හිඟ ණය ශේෂය හා පොලිය ලබා දෙන ණය මුදලින් අය කර ගැනීමට කිසිදු බාධාවක් ඇති නොවේ.

VII. මීට පෙර ලබා ගත් භාණ්ඩ ණය හිඟ ශේෂ ගෙවා මසක් ඉක්මවා ඇති අවස්ථා වලදී නැවත ඇපකර ණය ලබා දීමට මෙම අවස්ථාවේදී හැකියාව ඇත.

ඉහත ලබා දෙන ලද චක්‍රලේඛ පිළිබඳ සියළු සේවකයින් විධිමත්ව දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩි දුරටත් දන්වමි.

මෙයට,

සාමාන්‍යාධිකාරී (වැ.බ.)

පිටපත් :-

| | | |
|---|---|---|
| 01. ගරු සභාපතිතුමා /ගරු ලේකම්තුමා | - | අ.ම.තී. ක්‍රියාත්මක කල බවට/ දැ.පි. |
| 02. ගරු උප සභාපතිතුමා /ගරු උප ලේකම්තුමා | - | අ.ම.තී. ක්‍රියාත්මක කල බවට/ දැ.පි. |
| 03. ගරු පලාත් අධ්‍යක්ෂකතුමා | - | අ.ම.තී. ක්‍රියාත්මක කල බවට/ දැ.පි. |
| 04. නි/සාමාන්‍යාධිකාරීන් (ණය) | - | දැ.පි. |
| 05. නි/සාමාන්‍යාධිකාරීන් (මුදල්)/ගණකාධිකාරී | - | දැ.පි. |
| 06. නි/සාමාන්‍යාධිකාරීන් (සැලසුම් හා සංවර්ධන) | - | දැ.පි. |
| 07. අභ්‍යන්තර විගණක | - | දැ.පි. |
| 08. ගොණුවට | | |